**උතුරු පළාතේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

**-----------------------------------------------------------------------------**

උතුරු පළාතේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ චීන අපනයන - ආනයන බැංකුව අතර 2010 සැප්තැම්බර් 09 දින එළඹි අංක බීඑල්ඒ 201006 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු කළමනාකරණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතුවේ. ඔඩ්ඩුසුඩාන් - නැදුන්කර්නි මාර්ගයේ (B 334) කිලෝමීටර් 10.8 ක් හා මුලතිව් - පුලියන්කුලම (B 296) කිලෝමීටර් 41.8 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 5,928.30 කට සමාන එජඩො මිලියන 50.0 ක් වන අතර ඉන් රු.මිලියන 4,880.11 කට සමාන එජඩො මිලියන 42.5 ක් හෙවත් සියයට 85 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2010 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර 2011 අගෝස්තු 15 දින සිට කොන්ත්‍රාත්තුව බලපැවැත්වී තිබුණි. මාර්ගයේ පුනරුත්ථාපන වැඩ 2014 පෙබරවාරි 14 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද එම කාර්යයන් 2014 ජුනි 27 දින නිම කර එම මාර්ග, මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**---------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පරිචයක් වශයෙන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා තාවකාලික පාරිතෝෂික මුදලක් ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවා කාලපරිච්ඡේදය වෙනුවට කාර්ය මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ මෙන්ම වෙනත් ව්‍යාපෘතිවල කරන ලද සම්පූර්ණ සේවා කාලපරිච්ඡේදය ද පාරිතෝෂික ගණනය කිරීම සඳහා පදනම් කරගෙන තිබුණි. එබැවින් රු.74,137 ක අතිරේක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව පරිචයක් වශයෙන්, ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ වැටුප් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන ගෙවා තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ උපදෙස්වලට පටහැනිව රු.231,416 ක මුදලක් පොදුකාර්ය ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

-----------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

----------------------

ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය මූල්‍යායනය කිරීම හා සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|
| | | | 2013 වර්ෂය තුළ | 2013 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන ආනයන බැංකුව | 42.5 | 4,880.11 | 959.37 | 30.65 | 3,953.50 |
| ශ්‍රීලංර | 7.5 | 1,018.19 | 18.23 | 7.45 | 960.60 |
| | **50.0** | **5,898.30** | **977.60** | **38.10** | **4,914.10** |

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------------

මුලතිව් - පුලියන්කුලම මාර්ගයේ හා ඔඩ්ඩුසුඩාන් - නැඳුන්කර්නි මාර්ගයේ කිලෝමීටර් 52.6 ක පුනරුත්ථාපනය කිරීම් හා වැඩිදියුණු කිරීම් වැඩ 2011 අගෝස්තු 15 දින ආරම්භ කර තිබූ අතර 2014 ජුනි 27 දින පුනරුත්ථාපන කාර්යයන් නිමකර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාක්ෂණික පිරිවිතර වෙළුම 3 හි 114 වගන්තිය අනුව, පුනරුත්ථාපනය කරන ලද මාර්ග නඩත්තු කිරීම සඳහා වගකීම කොන්ත්‍රාත්කරුට පැවරී තිබූ අතර ඒ සඳහා රු.මිලියන 11.23 ක්වූ වෙන්කිරීම් කර තිබුණි. කෙසේ වුවද අතුරු ගෙවීම් සහතිකවලට අනුව, මාර්ග නඩත්තු කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 27.26 ක මුදලක් ඉල්ලා තිබූ අතර, ඉල්ලන ලද සම්පූර්ණ මුදලම ව්‍යාපෘතිය විසින් නිරවුල් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 14.9 වගන්තිය අනුව දෝෂ වගකීම් කාලය ඉකුත් වීමෙන් පසුව කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා රඳවා ගැනීම් මුදල් ඉංජිනේරු විසින් සහතික කළ යුතුය. කෙසේ වුවද දෝෂ වගකීම් කාලය සම්පූර්ණ වන 2014 ජුනි 27 දිනට පෙර බැංකු ඇපකරයක් ලබා ගැනීම මඟින් රඳවා ගැනීම් මුදල් වලින් කොටසක් වූ රු.මිලියන 143.53 ක් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් මුදා හැර තිබුණි.

(ඇ) පහත විස්තර කර ඇති පරිදි දෝෂ වගකීම් කාලය තුළ සම්පූර්ණ කළ යුතු පුනරුත්ථාපන වැඩ විශාල ප්‍රමාණයක් සහිත මාර්ග කොටස් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාර ගෙන තිබූ බව අනාවරණය විය.

| මාර්ගයේ නම | භාර ගන්නා අවස්ථාවේදී නිම කළ යුතුව තිබූ හිඟ කාර්යයන් |
|---|---|
| මුලතිව් - පුලියන්කුලම මාර්ගය | 117 |
| ඔඩ්ඩුසුඩාන් - නැදුන්කර්නි මාර්ගය | 39 |
| එකතුව | 156 |

විගණනයේ මතය අනුව, හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ක්‍රියාකරන බවට තහවුරු කරගැනීම සඳහා දෝෂ වගකීම් කාලය අවසානයේදී ශක්තිමත් සමාලෝචන පරිපාටීන් යොදාගත යුතුය.

(ඈ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද නිම කිරීම් ප්‍රකාශනයට (Statement of Completion) අනුව, ප්‍රමාණ පත්‍රයන්හි වැඩිපුර ප්‍රතිපාදනයන් කර තිබීම හේතුවෙන් මාර්ග පුනරුත්ථාපන සඳහා පිරිවැය මත රු.මිලියන 20.28 ක ඉතිරිකිරීම් වාර්තා වී තිබුණි. එබැවින් කොන්ත්‍රාත්තුවේ ඉහළ පිරිවැය මත ගණනය කරන ලද වැඩපූර්ව අත්තිකාරම් ලබා දීමේදී අතිරේක මූල්‍ය ලාභයක් සඳහා අවස්ථාවක් කොන්ත්‍රාත්කරුට ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) 2012 අගෝස්තු 11 දිනැති අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවල අවශ්‍ය පරිදි කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සියලු කරුණු සැලකීම මඟින් මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. මුලතිව් - පුලියන්කුලම මාර්ගයේ හා ඔඩ්ඩුසුඩාන් - නැදුන්කර්නි මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා වැඩ විෂය පථය පසුව වෙනස් කර තිබූ අතර රු.මිලියන 3,055 ක

අතිරේක පිරිවැයක් ඒ සඳහා දරා තිබුණි. මේ සම්බන්ධයෙන් වැඩ විෂය පථය වෙනස් කිරීම සඳහා වගකිව යුතු වූ පුද්ගලයන්ගෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තියට අනුකූලව පැහැදිලි කිරීම් කැඳවා නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

මුල් වැඩ විෂය පථයේ හඳුනාගෙන නොතිබූ උතුරු පළාතේ පළාත් මාර්ග 4 ක් ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කර තිබූ බවත් ඒ සඳහා රු.මිලියන 934.03 ක් වැය කර තිබූ බවත් නිරීක්ෂණය විය.

| වැඩවල ස්වභාවය | වැයකළ මුදල |
|---|---|
| | රු.මිලියන |
| පුදුක්කුඩිඉරිප්පු නැවත පදිංචි කිරීම් ප්‍රදේශයේ මාර්ග පුනරුත්ථාපනය කිරීම | 497.53 |
| A 34 මාර්ගයේ සිට ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය කිරීම | 63.78 |
| ත්‍රිකුණාමලය - පුල්මොඩෙයි මාර්ගයේ මතුපිට ඇස්පල්ට් අතුරා පිළියම් කිරීම | 71.16 |
| පුදුකුඩිඉරිප්පු සිට පදවිය මංසන්ධිය දක්වා මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 301.56 |
| | 934.03 |